*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 14-Iss. II, Dec. 2023, 1-12.*
DOI: https://doi.org/10.4038/p.v14i2.43

# බෞද්ධ ආචාරධර්මයන්හි ස්වභාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# [An Investigative Study of the Nature of Buddhist Ethics]

**Gonalagoda Nanda**[1]

## Abstract

When it comes to Buddhist Philosophy, it has several branches such as epistemology, metaphysics, ethics, logic etc. Among them, ethics can be introduced as a major branch. The ethics taught by the Buddha related to morality is the Buddhist ethics. The role of Buddhist ethics is objective as well as practical because the Buddha's teaching is directly connected with reality. However, there have emerged many debates about Buddhist ethics in the academic world in comparison to western theories of ethics. This article mainly focuses on investigating the nature of Buddhist ethics depending on early Buddhism under three sub-themes; the structure of Buddhist ethics, the foundation of Buddhist ethics, and Buddhist moral standards. Accordingly, this article expects to make comprehensive commentary on Buddhist ethics by using the research of scholars who have done research on the Buddhist ethics and comparatively discuss with western ethical theory.

**Keywords:** Buddhism, Ethics, Morality, Philosophy, Theory

1 Lecturer, Department of Social Science and Comparative Studies, Bhiksu University of Sri Lanka.
E-mail:gnanda@busl.ac.lk https://orcid.org/0000-0002-6255-4530

Received: 10 July 2023, Accepted revised version: 20 September 2023.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

**හැඳින්වීම**

ආචාරධර්ම වූ කලී වාස්තවික පැවැත්ම යහපත් වනු පිණිස වන්නකි. එකී වාස්තවික පැවැත්ම සාධනය කිරීමෙහිලා උපයෝගී වන පරිපූර්ණ වූ ආචාරධර්ම පද්ධතියකින් බුදුදහම සමන්විතය. ථෙරවාද, මහායාන හා තන්ත්‍රයාන වශයෙන් වෙන් වෙන්ව බුදුදහම පිළිබඳ අධ්‍යයනය කළ හැකි බැවින් මෙම අධ්‍යයනය ථෙරවාද මුල් බුදුසමයට සීමා වෙමින් සිදු කරනු ලැබේ. විසුළ තේමාවක් වශයෙන් හැඳින්වෙන බෞද්ධ ආචාරධර්ම අද්‍යතනයෙහි විවිධ තේමා ඔස්සේ වර්ග කර අධ්‍යයනය කළ ද මෙහිදී කරුණු ත්‍රිත්වයක් මත පදනම් වෙමින් පමණක් කරුණු ගොනු කිරීම සිදුකරනු ලැබේ. ඒ අනුව බෞද්ධ ආචාරධර්මයන්හි සැකැස්ම, පදනම හා බෞද්ධ සදාචාර මිණුම්දඬු යන තේමාවන් ආවරණය කිරීම මෙමගින් සිදු වේ. විශේෂයෙන් බටහිර සදාචාර න්‍යාය ඔස්සේ බෞද්ධ ආචාරධර්ම හඳුනාගත හැකි ආකාරය පිළිබඳ කරුණු තුලනය කිරීමක් ද මෙහිදී සිදුකෙරේ. මෙකී ප්‍රවේශයන් විමර්ශනය කිරීමෙන් බෞද්ධ ආචාරධර්මයන්හි ස්වභාවය හඳුනාගත හැකිය.

**සාහිත්‍ය විමර්ශනය**

මෙම අධ්‍යයනය මූලික වශයෙන් පෙළදහම ඇසුරු කරමින් සිදු කෙරෙන බැවින් බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව භාවිත කරනු ලැබේ. යොදාගනු ලබන මූලාශ්‍රයන් පඨිතය තුළ දක්වමින් කරුණු සාකච්ඡා කිරීම සිදුකෙරේ. පී. ඩී. ප්‍රේමසිරි (1992) සූරීන් විසින් රචිත 'බෞද්ධ ආචාර ධර්ම' යන කෘතිය බෞද්ධ ආචාරධර්ම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී වැදගත් වේ. බෞද්ධ ආචාරධර්මයන්හි ස්වභාවය හඳුනාගැනීමේ දී මෙය යොදාගත හැකි වුව ද තේමාගත කරුණු පුළුල් ලෙස සාකච්ඡා කිරීමක් මෙම කෘතියෙහි දැකිය නොහැකිය. ගුණපාල ධර්මසිරි (1996) රචිත 'බෞද්ධ සදාචාරයේ මූලධර්ම' කෘතියෙහි බෞද්ධ සදාචාරයෙහි පසුබිම පිළිබඳ ප්‍රාමාණික විග්‍රහයක් ඇතුළත් වේ. සදාචාර මිණුම්දඬු පිළිබඳ පැහැදිලි කිරීමක් ද අන්තර්ගතය. නමුත් අධ්‍යයනාපේක්ෂිත තේමාගත කරුණු විග්‍රහාත්මකව සාකච්ඡා කර නොමැත.

ඩබ්ලිව්. කේ. ෆ්‍රැන්කීනා (1998) රචිත පී. ඩී. ප්‍රේමසිරි විසින් පරිවර්තනය කර ඇති 'ආචාරවිද්‍යාව' යන කෘතිය බටහිර දර්ශනය පිළිබඳ හඳුනාගැනීමේ දී උපකාරී වේ. එහි අන්තර්ගත විචාරාත්මක හැඳින්වීමේ දී ප්‍රේමසිරි විසින් සුවිශේෂී පැහැදිලි කිරීමක් සිදුකර තිබේ. බෞද්ධ ආචාරධර්මයෙහි ස්වභාවය පිළිබඳ තුලනාත්මක පැහැදිලි කිරීමක් එහි අන්තර්ගත වේ. පර්යේෂණයට අදාළ තොරතුරු ඉන් ලබාගත හැකි වේ. සුමේධ වීරවර්ධන (2007) සම්පාදිත 'ආචාර විද්‍යා අධ්‍යයන ලිපි' යන ලිපි සංග්‍රහයෙහි බෞද්ධ ආචාරධර්ම පිළිබඳ තුලනාත්මකව කරුණු දක්වාලීමක් සිදුකර ඇත. අවශ්‍ය අවස්ථාවල එම ලිපි ද භාවිත කරමින් කරුණු පැහැදිලි කිරීම සිදුකර ඇත. කේ. එන්. ජයතිලක බෞද්ධ ආචාරධර්ම පිළිබඳ විවිධ පැහැදිලි කිරීම් සිදුකර තිබේ. ජයතිලකයන්ගේ අදහස් අන්තර්ගත 'මහාචාර්ය කේ.එන්. ජයතිලක දර්ශනය' මෙහිදී සුවිශේෂී වේ. මෙම මූලාශ්‍රයන්ට අමතරව ආශ්‍රිත ග්‍රන්ථයන්හි අන්තර්ගත මූලාශ්‍රය භාවිත කරමින් මෙම පර්යේෂණය සිදුකරනු ලැබේ.

**පර්යේෂණ ගැටලුව**

මෙම පර්යේෂණයේ දී විමර්ශනයට ලක් කරනු ලබන පර්යේෂණ ගැටලු පහත සඳහන් පරිදි වේ. ප්‍රධාන පර්යේෂණ ගැටලුව: බෞද්ධ ආචාරධර්මයන්හි ස්වභාවය කෙබඳු ද?

පර්යේෂණයේ උප ගැටලු
ආචාරධර්මයන්හි සැකැස්ම කෙබඳු ද?
බෞද්ධ ආචාරධර්මයන්හි පදනම කෙබඳු ද?
බෞද්ධ සදාචාර මිණුම්දඬු කෙබඳු ද?

**පර්යේෂණ අරමුණ**

මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වනුයේ මුල් බුදුසමයෙහි එන ආචාරධර්මවල ස්වභාවය

හඳුනාගැනීමයි. ඒ යටතේ කරුණු කිහිපයක් ආවරණය වේ. බෞද්ධ ආචාරධර්මයන්හි සැකැස්ම, බෞද්ධ ආචාරධර්මයන්හි පදනම හා බෞද්ධ සදාචාර මිණුම්දඬු යන මාතෘකා පිළිබඳ ගැඹුරින් විමර්ශනය කිරීම මෙහි අරමුණු වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ ග්‍රන්ථ සංධාර පර්යේෂණ ක්‍රමවේදය උපයුක්ත කරමින් මෙම අධ්‍යයනය සිදුකර ඇත.

**පර්යේෂණයේ වැදගත්කම**

බෞද්ධ ආචාරධර්මයන්හි සැකැස්ම පිළිබඳ සිදු කරනු ලබන මෙම අධ්‍යයනය බෞද්ධ ආචාරධර්මයන්හි විද්‍යමාන ප්‍රධාන තේමා ත්‍රිත්වයක් ආවරණය කරනු ලැබේ. එබැවින් ප්‍රස්තුතගත තේමා සම්බන්ධයෙන් සිදුකරනු ලබන අධ්‍යයනවල දී මෙන්ම බෞද්ධ දර්ශනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන අධ්‍යයනවල දී ද මෙම පර්යේෂණය වැදගත් වේ.

**බෞද්ධ ආචාරධර්මයන්හි සැකස්ම**

බුදුදහමෙහි අන්තර්ගත ආචාරවාදී අදහස් බෞද්ධ ආචාරධර්ම වශයෙන් හැඳින්විය හැකිය. ඇතැම් තැනෙක බෞද්ධ ආචාරධර්ම යන්න අනුත්තර විද්‍යාචරණ යන නාමයෙන් ද ව්‍යවහාර කර තිබේ (පේමසිරි හිමි, 2010: 02). බෞද්ධ ආචාරධර්මයන්හි විශේෂත්වය වනුයේ එය දේවවාදී හෝ වෙනත් අද්භූත යමක නිර්මාණයක් නොවීමයි (Clayton, 2016: 280). එය බුදුන් වහන්සේ විසින් සිය අවබෝධයෙන් ලබාගත් දැනුම මගින් දේශනා කරන ලද්දකි. බෞද්ධ ආචාරධර්මයන්හි සැකැස්ම අධ්‍යයනයට පූර්වයෙන් මුල් බුදුදහමෙහි ආචාරධර්මවලට හිමි ස්ථානය නොහොත් තත්ත්වය පිළිබඳ විමසිය යුතුය.

දර්ශන විෂය අධ්‍යයනය කිරීමේ දී ඥානවිභාගය, අධිභෞතික විද්‍යාව, තර්ක ශාස්ත්‍රය හා ආචාරවිද්‍යාව යන ප්‍රධාන විභේදන උපයෝගී වේ. ඉන් ආචාරවිද්‍යාවට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. ලොව වාස්තවික පැවැත්ම සුරැකීමෙහිලා ආචාරවිද්‍යාව සිදු කරනුයේ සුවිශේෂී කාර්යයකි. බෞද්ධ දර්ශනයෙහි අන්තර්ගත ආචාරධර්මවල ස්වභාවය ද එසේය. මුල් බුදුදහමෙහි අන්තර්ගතය සම්බන්ධයෙන් විග්‍රහ කරන ගුණපාල ධර්මසිරි සඳහන් කරනුයේ එහි මූලික කොටස් කිහිපයක් දැකිය හැකි බවයි.

- ඥානවිභාගය
- විශ්වය සහ ලෝකය පිළිබඳ මතය
- සදාචාර විමර්ශනය
- පරම විමුක්තිය හෙවත් නිර්වාණය පිළිබඳ මතය (ධර්මසිරි, 1996: 1-2)

මේ අනුව ධර්මසිරි මතය වනුයේ සදාචාර දර්ශනය බුදු දහමෙහි අනිවාර්ය අංගයක් සේ භාවිත වී ඇති බවයි. බුදුදහමෙහි අවසන් අරමුණ වශයෙන් හැඳින ගත හැකි වනුයේ නිර්වාණය සාක්ෂාත් කිරීමයි. එය ප්‍රධාන හා අන්තර් සම්බන්ධතාවයකින් යුක්ත සාක්ෂාත්කරණය කිරීමකින් සමන්විත වනබව ප්‍රේමසිරි විසින් දක්වා ඇත.

- මෝක්ෂය
- ප්‍රතිවේධ
- සදාචාර පරිපූර්ණත්වය (ප්‍රේමසිරි, 1992: 03)

මෙයින් මෝක්ෂය යනුවෙන් අදහස් කර ඇත්තේ විමුක්තිය ලබා ගැනීමය. දුකින් හෙවත් අතෘප්තිකර තත්ත්වයෙන් මිදීම ඉන් සිදු කරයි. එහිදී ප්‍රතිවේධය හෙවත් අවබෝධය තිබිය යුතුය. සම්මා ඥානය ආදි අවශ්‍ය ඥානයෙන් හා ප්‍රඥාවෙන් යුක්තවීම ඉන් අදහස් වේ. සදාචාර පරිපූර්ණත්වය යනු පුද්ගලයා අරහත් පුද්ගලයෙකු ලෙස හැඳින්විය හැකි තත්ත්වයට පත්වීමයි. එනම් රහත් බවයි. ඒ අනුව බුදු දහමෙහි පරම තත්ත්වය අවබෝධ කිරීම ආචාරධර්මයන්හි අවසන් තත්ත්වයකට පත්වීමක් හා සමානය.

ථෙරවාදයට අනුව බුදු, පසේබුදු හා අර්හත් යන තුන්තරා බෝධියෙන් කුමන බෝධියකින් අවබෝධයට පැමිණිය ද එම පැමිණි ගමන් මග ආචාරාත්මක හා ඥාන සම්ප්‍රයුක්ත ප්‍රඥාවෙන් යුක්ත වූවකි. එබැවින් බෞද්ධ ආචාරාත්මක බවෙහි අවසන් අවස්ථාව වශයෙන් එය සැලකීමෙහි වරදක් නොමැත. එය සදාචාර පාරප්‍රාප්තියකි (ප්‍රේමසිරි, 1992, 03).

මෙය වැඩි දුරටත් විග්‍රහ කරන කේ.එන්. ජයතිලකයන් දක්වා ඇත්තේ 'අරහත් තත්ත්වය එක්තරා සදාචාර පරිපූර්ණත්වයක් වුවද එය ආරෝපිත සදාචාරයක් නොවන බවයි'. එය ස්වාභාවිකව හෝ නිසර්ගයෙන් ඇතිවන්නකි (ජයතිලක, 2001: 217). ස්වාභාවිකව සිදු වුවද ඒ සඳහා ආචාරාත්මක හා ඥාන සම්ප්‍රයුක්ත ප්‍රඥාවෙන් ක්‍රියා කළ යුතුය. එසේ නොවන්නේ නම් එය උදාකළ නොහැකිය. එහෙත් නිවන් අරමුණු (නිෂ්ටාව) කරගත් ආචාරාත්මක ඉගැන්වීම්වලට අමතරව අතුරු නිෂ්ටාවන් ද ඇත. නිවන් අවබෝධ කිරීම සියල්ලට එකවර සිදු කිරීමට නොහැකි බැවින් දෛනික ජීවිතයේ සුවපත්භාවයට අයත් ආචාරාත්මක ඉගැන්වීම් ද සිදුකර තිබේ (ඤාණසුමන හිමි, 1980: 136). එබැවින් මෙලොව හා පරලොව යන උභය ලෝකයෙහි අභිවෘද්ධියට අදාළ ඉගැන්වීම් බුදුසමයෙහි අන්තර්ගතය. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය ඒ සඳහා නිදසුනකි. එහි අන්තර්ගතව ඇත්තේ 'දිට්ඨධම්ම හිතාය, දිට්ඨධම්ම සුඛාය' මෙලොව හිතසුව පිණිස, 'සම්පරාය හිතාය, සම්පරාය සුඛාය' පරලොව හිතසුව පිණිස අදාළ ඉගැන්වීමකි (ව්‍යග්ඝපජ්ජ සූත්‍රය, 234). ඒ අනුව පැහැදිලි වනුයේ බුදුදහමෙහි ආචාරධර්මවලට ප්‍රමුඛතාවක් ලබා දී තිබෙන බවයි. එය පුද්ගල නිවන අරමුණු කරගත්තක් වුවද නිවන් දකින තුරු කාලය සුවපත් වීම පිණිස අදාළ වන්නක් බව ද පැහැදිලි වේ.

බෞද්ධ ආචාරධර්මයන්හි ස්වභාවය පිළිබඳ විමසීමේ දී පැහැදිලි වනුයේ බටහිර දර්ශනයෙහි මෙන් නිශ්චිතව වෙන්ව හඳුන්වන ලද ආචාරධර්ම පද්ධතියක් නොමැති බවයි. බුදුන් වහන්සේ දේශනා කළ විවිධ දේශනාවන්හි අන්තර්ගත සදාචාරය හා සම්බන්ධ කොටස් ආචාරධර්ම සේ භාවිත කරනු ලැබේ. විශේෂයෙන් සූත්‍ර පිටකයෙහි හා විනය පිටකයෙහි මෙවැනි ආචාරාත්මක ඉගැන්වීම් දැකිය හැකිය. විවිධ හේතු කරණකොට ඇති වූ සිදුවීම් හා අවස්ථාවන්ට අනුව විවිධ ආචාරාත්මක දේශනා සිදුකර තිබේ. බෞද්ධ ආචාරධර්මයන්හි විශේෂත්වය වනුයේ එක් කොටසකට පමණක් සීමා වූ ආචාරධර්ම පද්ධතියක් දැකිය නොහැකි වීමයි. එබැවින් විවිධ ක්ෂේත්‍රයන්ට අනුකූල කළ හැකි ආචාරධර්ම පද්ධතියකින් බුදුදහම සමන්විත වේ.

- පරිසරය හා සම්බන්ධ ආචාරධර්ම
- දේශපාලනය හා සම්බන්ධ ආචාරධර්ම
- ආර්ථිකය හා සම්බන්ධ ආචාරධර්ම
- සමාජය හා සම්බන්ධ ආචාරධර්ම
- වෘත්තීය හා සම්බන්ධ ආචාරධර්ම

ආදි නොයෙක් ක්ෂේත්‍රයන්හි ව්‍යාප්ත වූ ආචාරධර්ම බුදුදහමෙහි දැකිය හැකි වේ. එබැවින් බෞද්ධ ආචාරධර්ම යන්න විස්තෘත තේමාවක් ලෙස පෙන්වා දිය හැකිය. බෞද්ධ ආචාරධර්මයන්හි ස්වභාවය සම්බන්ධයෙන් විග්‍රහ කරන විචාරකයන් බටහිර සදාචාර න්‍යායන් හා තුලනය කරමින් කරුණු දක්වා ඇත. බෞද්ධ ආචාරධර්මයන්හි සැකස්ම තුලනාත්මකව හඳුනාගැනීම උදෙසා එයින් කිහිපයක් පිළිබඳ මෙතැන් සිට කරුණු දක්වනු ලැබේ.

විශේෂයෙන් බටහිර සදාචාර දර්ශනයෙහි සාකච්ඡා වන ප්‍රාමාණික මූලධර්ම න්‍යාය මත පිහිටා තුලනාත්මක අධ්‍යයන කිහිපයක් සිදුකර ඇත. බටහිර සදාචාර දාර්ශනිකයන්ට අනුව සාධ්‍යතාවාදය හා යුක්ත්‍යාත්මවාදය යනුවෙන් ප්‍රාමාණික මූලධර්ම ද්වයකි (http://repo.busl.ac.lk/handle/1/2518). මෙම

න්‍යායයන් නැවත අනු කොටස්වලට බෙදා දැක්වේ. සාධ්‍යතාවාදය කොටස් තුනකට ද යුක්ත්‍යාත්මවාදය කොටස් දෙකකට ද බෙදිය හැකිය. මේ පිළිබඳ කේ.එන්. ජයතිලක මතය වනුයේ බෞද්ධ ආචාරධර්ම යුක්ත්‍යාත්මවාදී වනවාට වඩා සාධ්‍යතාවාදයට නැඹුරුවේය යන්නයි (ජයතිලක, 2001: 260). එහෙත් යුක්ත්‍යාත්මවාදය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප වන බවක් එහි සඳහන් නොවේ. 'කත කරණීය' වැනි උද්ධෘතයන් උපයෝගී කරමින් එතුමා දක්වා ඇත්තේ අවසාන සාධූත්වය සාක්ෂාත් කිරීම මිනිසා සතු මූලික යුතුකම වන බවත් එය අත්පත් කරගන්නා අන් සියලු යුතුකම්වලින් නිදහස් වන බවත්ය. ඒ අනුව යුක්ත්‍යාත්මවාදී අදහස් බෞද්ධ ආචාරධර්මවල අන්තර්ගත බව ජයතිලකයන්ගේ මතයයි.

ගුණපාල ධර්මසිරි දක්වන මතය වනුයේ බෞද්ධ සදාචාරය සාධ්‍යතාවාදයට අයත් උපයෝගිතාවාදයක් බවයි. එය වැඩි දුරටත් විග්‍රහ කරමින් දක්වා ඇත්තේ සුඛපරමවාදයක් නොව පරමාදර්ශී උපයෝගිතාවක් වන බවයි. එහෙත් කතුවරයාගේ අවසන් නිගමනය වනුයේ බෞද්ධ සදාචාරයෙහි ප්‍රාමාණික මූලධර්ම ද්විත්වයම ඇති බවත් එය ඉක්මවා යන බවත්ය (ධර්මසිරි, 1996: 35-36). සාධ්‍යතාවාදී විග්‍රහයට අනුව යමින් හෝමාගම ධම්මානන්ද හිමියන් සඳහන් කරනුයේ බෞද්ධ ආචාරධර්මයන්හි සාධ්‍යතාවාදී ලක්ෂණ ඇති බවත් උපයෝගිතා ලක්ෂණ දරන බවත්ය (ධම්මානන්ද හිමි, 2004: 104). ඩී.ජේ. කලුපහනයන් දක්වා ඇත්තේ බෞද්ධ ආචාරධර්මවල උපයෝගිතා හා යුක්ත්‍යාත්මවාදී ලක්ෂණ අන්තර්ගත බවයි (කලුපහන, 2005: vii). මේ පිළිබඳ අදහස් දක්වන පද්මසිරි ද සිල්වාට අනුව බෞද්ධ ආචාරධර්ම යුක්ත්‍යාත්මවාදය හෝ උපයෝගිතාවාදයට ඉදිරියෙන් පවතී (Silva, 1998: 69). Damiem keown ගේ අදහස වනුයේ ථෙරවාද සම්ප්‍රදායෙහි ව්‍යාප්තව ඇත්තේ සාධ්‍යතාවාදී පදනම බවය (Keown, 1992: 14). මීට අමතරව දාපනේ චන්දරතන හිමියන් දක්වා ඇත්තේ බෞද්ධ ආචාරධර්ම සාධ්‍යතාවාදී හා යුක්ත්‍යාත්මවාදී වන බවයි. නිවන අරමුණු වීම මත සාධ්‍යතාවාදයක් දැකිය හැකි බවත් සිගාලෝවාද වැනි සූත්‍රයන්ගෙන් යුක්ත්‍යාත්මවාදයක් ගම්‍ය වන බවත් විවිධ මතවාද උපයුක්ත කරමින් ඇත. නමුත් උන්වහන්සේගේ මතය වනුයේ පරමත්ථ සංකල්පයට අනුව ඒ කිසිවක් නොමැති බැවින් ශූන්‍ය වන බවයි (Chandaratana Thero, researchgate).

බෞද්ධ ආචාරධර්ම බටහිර සදාචාර න්‍යයායන් සමග සමවිසම වන ආකාරය ශාස්ත්‍රීයව පර්යේෂණයට ලක්කර ඇත. මේ සම්බන්ධයෙන් තව දුරටත් විමසීමේ දී ප්‍රකට වනුයේ සාධ්‍යතාවාදය මෙන්ම යුක්ත්‍යාත්මවාදී ආකල්පය බෞද්ධ ආචාරධර්මවල ඇතුළත් බවයි. එහෙත් සම්පූර්ණ වශයෙන් බෞද්ධ ආචාරධර්ම එම මූලධර්මයන්ට සීමා වෙති'යි දැක්විය නොහැකිය. ඊට හේතු වනුයේ බුදුන් වහන්සේ 'මෙය යුක්ත්‍යාත්මවාදී ය, මෙය සාධ්‍යතාවාදී ය' යනුවෙන් වෙන් වෙන්ව ආචාරධර්ම පද්ධතියක් දේශනා නොකිරීමයි.

සිගාලෝවාද සූත්‍රයෙහි (සිගාලක සූත්‍රය) අන්තර්ගත සදිසා නමස්කාරයෙන් විශද වනුයේ යුතුකම හා වගකීම සම්බන්ධවයි. එහෙත් යුක්ත්‍යාත්මවාදයෙහි ගැලී නොසිට එය ඉක්මවා යන ස්වභාවයක් බෞද්ධ ආචාරධර්මවල අන්තර්ගත වේ. ඊට හේතුව වනුයේ චේතනාවයි. ආචාරාත්මක ක්‍රියා විග්‍රහයේ දී බෞද්ධ දර්ශනය ප්‍රමුඛතාවක් ලබා දී ඇත්තේ චේතනාවටය (ඤාණසුමන හිමි, 243). සාධ්‍යතාවාදය සම්බන්ධයෙන් විමසීමේ දී ද ගම්‍ය වනුයේ බුදුදහම එයට පමණක් සීමා නොවන බවයි. සාධ්‍යතාවාදයෙහි අනුකොටසක් වන උපයෝගිතාවාදයෙහි බෞද්ධ නිෂ්ටාව හා සම්බන්ධයක් පවතී. එසේම ආත්මාර්ථ සුඛපරමවාදය හා පරාර්ථ සුඛපරමවාදය යන අන්තයන්ගෙන් වියුක්ත වූ ආචාරාත්මක උපදේශයක් බෞද්ධ දර්ශනයෙහි දැකිය හැකිය. එහෙත් ආත්මාර්ථ

සුඛපරමවාදය ප්‍රතික්ෂේපිත නොවේ. 'අත්තාහි අත්තනො නාථො' (අත්ත වග්ගය, 160 ගාථාව) යන ධම්මපද ගාථාවෙන් එය විශද වේ. තවද ධම්මපදයෙහි 'අත්තදත්ථං පරත්‍ථේන' (අත්ත වග්ගය, 166 ගාථාව) යන ගාථාවෙන් දැක්වෙනුයේ ද පරාර්ථය පිණිස ස්වාර්ථය විනාශ නොකරන්න යන්නය. එහෙත් 'සබ්බේ තසන්ති දණ්ඩස්ස' (දණ්ඩ වග්ගය, 129 ගාථාව) යන ධම්මපද ගාථාවෙන් ප්‍රකට වනුයේ තමා උපමාවට ගනිමින් නොනසන්න, නොනස්සවන්න යන්නය. එසේම අංගුත්තර නිකායෙහි දක්වා ඇත්තේ ආත්මාභිවෘද්ධියෙහි මෙන්ම පරාර්ථ අභිවෘද්ධියෙහි යෙදෙන පුද්ගලයා යහපත් බවයි (බිජ්පනිසන්ති සූත්‍රය, 184) ඒ අනුව මෙම කෙටි දක්වාලීමෙන් පැහැදිලි වනුයේ බෞද්ධ ආචාරධර්මවල සාධ්‍යතාවාදී ලක්ෂණ මෙන්ම යුක්ත්‍යාත්මවාදී ලක්ෂණ අන්තර්ගත වන බවයි. එහෙත් බෞද්ධ ආචාරධර්ම ඒ තුළ සීමා වී නොපවතී. පරම නිෂ්ඨාව වන නිර්වාණය සාක්ෂාත් කළ කල්හි මෙම සීමාවන්ගේ ස්වභාවයෙන් වියුක්ත වේ. මෙකී සාධ්‍යතාවාදයටත් යුක්ත්‍යාත්මවාදයටත් අමතරව 'ස්වර්ණමය රීතිය' යන මූල ධර්මය ද බුදුදහමෙහි පවතින බව පෙන්වා දී තිබේ (වීරවර්ධන, 2007: 33). පෙර දැක් වූ 'සබ්බේ තසන්ති දණ්ඩස්ස' යන ගාථා අර්ථය පරිදි තමන් විඳීමට අකමැති ක්‍රියාවක් වෙනත් පුද්ගලයන්ට ද නොකළ යුතු බව පැවසීම ස්වර්ණමය රීතියෙහි අදහසයි. ජයතිලක සිය මතය වැඩි දුරටත් විස්තර කරමින් දක්වනුයේ බෞද්ධ ආචාරධර්ම ආචාරාත්මක සාර්වවාදයක් (Ethical Universalism) වන බවයි (ජයතිලක, 256). මීට අතිරේකව සදාචාර න්‍යායක් වන ව්‍යවහාරික ආචාරධර්ම ද බුදුදහමෙහි අන්තර්ගත වන බව පෙන්වා දිය හැකිය.

මේ ආකාරයට බෞද්ධ ආචාරධර්මයන්හි ස්වභාවය අධ්‍යයනයට ලක්කළ හැකි අතර එය අධිභෞතික වූ හෝ ප්‍රායෝගිකකරණය කළ නොහැකි ආචාරධර්මයක් නොවන බව පෙන්වා දිය හැකිය. බෞද්ධ ආචාරධර්මයන්හි අවසානය වනුයේ නිර්වාණය සාක්ෂාත් කිරීමයි. ඉන් පසු සදාචාරයක අවශ්‍යතාවක් නොමැත. ඊට හේතු වනුයේ සදාචාර කඩවීම් තුන්තරා බෝධිය ලබාගත්තකුගෙන් සිදු නොවීමයි. පරිපූර්ණ ආචාරධර්මයක් ඇති වීමට නම් උපයෝගිතාවාදී මෙන්ම යුක්තිසහගත වීමේ පදනම තිබිය යුතු බව ෆ්‍රැන්කිනාගේ මතය වේ (ෆ්‍රැන්කිනා, 32). මෙම මතය අනුව බලන විට පෙනී යන්නේ බෞද්ධ ආචාරධර්ම පරිපූර්ණ ආචාරධර්ම පද්ධතියකින් සමන්විත වන බවය.

## බෞද්ධ ආචාරධර්මයන්හි පදනම

මේ ආකාරයෙන් හඳුනාගත හැකි බෞද්ධ ආචාරධර්මයන්හි මූලික පදනම සීලය වන බවට කරුණු දක්වා තිබේ (ධම්මානන්ද හිමි, 110). බෞද්ධ ආචාරධර්මවල සීලමය පදනම පඤ්චසීලය වන බව ඤාණරතන හිමියන්ගේ අදහසයි (ඤාණරතන හිමි, 09). එහෙත් පඤ්චසීලය පමණක් සීලයෙහි පදනම වශයෙන් ගැනීම යෝග්‍ය නොවේ. ඊට හේතු වනුයේ සීලය ගිහියාට පමණක් නොව පැවිද්දාට ද අවශ්‍ය වීමය. සාමණේරයන් වහන්සේට සාමණේර දසසීලය ද උපසපන් භික්ෂුවට උපසපන් සීලය ද වශයෙන් පැවිදි අයට වෙනම සීලයක් බුදුදහමේ අන්තර්ගත වේ. එබැවින් ගිහියාට මූලිකව පඤ්චසීලය ද ඉන් අනතුරුව අටසීලය හා දසසීලය අනුදැන වදාරා ඇත. සීලය යනුවෙන් හඳුන්වා ඇත්තේ කය වචනයෙහි සංවරයයි 'කාය වාචානං සමොදානං සීලං' ප්‍රාණඝාතය, අදත්තාදානය, කාම මිථ්‍යාචාරය යන කායික වැරදි හා මුසාවාද, පරුෂාවාචා, පිසුණාවාචා හා සම්පප්ඵලාපය යන වාචසික වැරදිවලින් වියුක්ත වීම සීලය වන බව පිළිගත්තකි. මෙම සීලය සමග අවශ්‍ය වන තවත් සාධකයක් ඇත. එය ප්‍රඥාවයි. ප්‍රඥාවෙන් තොරව සීලයක් පූරණය විය නොහැකිය. ඒ අනුව ආචාරධර්මයන්හි පදනම වශයෙන් සීලය හා ප්‍රඥාව පෙන්වා දිය හැකිය. බුදුදහමට අනුව ප්‍රඥාවෙන් සීලය පිරිසිදු වන අතර සීලයෙන්

ප්‍රඥාව පිරිසිදු වේ (සොණදණ්ඩ සූත්‍රය, 244). ඒ අනුව පැහැදිලි වනුයේ බෞද්ධ ආචාරධර්මයන්හි පදනම සීලය පමණක් නොව සීලය හා ප්‍රඥාව ද වන බවයි. ඊට හේතුව වනුයේ ආචාරාත්මක බවක් ඇති වීමට සීලය තිබීම අවශ්‍ය වීමත් සීලයක් පැවතීමට ප්‍රඥාව අවශ්‍ය වීමත්ය.

සීලෙ පතිට්ඨාය නරො සපඤ්ඤො - චිත්තං පඤ්ඤංච භාවයං

ආතාපි නිපකො භික්ඛු - සො ඉමං විජටයෙ ජටං (ජටා සූත්‍රය, 294)

විසුද්ධිමාර්ගයෙහි ආරම්භක ගාථාව වශයෙන් ද භාවිත කර ඇත්තේ ඉහත ගාථාවයි. එහි දක්වා ඇත්තේ සීලය පදනම වශයෙනි. සීලයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වර්ධනය කළ යුතු බව ඉන් කිය වේ. සීලයෙහි පිහිටුවාගත් සිත ද ඥානය ද වර්ධනය කළ පුද්ගලයා සියලු අභ්‍යන්තර හා බාහිර ගැටුම්වලින් විනිර්මුක්ත වේ (විජේරත්න, 2005: 158). ඒ අනුව බෞද්ධ ආචාරධර්මයන්හි පදනම වශයෙන් සීලය ප්‍රධාන කර ඇති ත්‍රිශික්ෂාව පෙන්වා දිය හැකිය. එතෙක් පිළිගත් කාමසුඛල්ලිකානු යෝගය හා අත්තකිලමථානු යෝගය යන අන්ත දෙක වෙනුවට බුදුන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාව අනුදැන වදාරා ඇත. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීම මධ්‍යම ප්‍රතිපදාවයි.

සම්මා දිට්ඨි

සම්මා සංකප්ප

සම්මා වාචා

සම්මා කම්මන්ත

සම්මා ආජීව

සම්මා වායාම

සම්මා සති

සම්මා සමාධි

මේ ආකාරයට හැඳින්වෙන මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළ යුතු බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. එනයින් සලකන කල බෞද්ධ ආචාරධර්ම වැඩීමේ මාර්ගය වශයෙන් ද හඳුනාගත හැකි වනුයේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. බෞද්ධ ආචාරධර්මයන් පුහුණු කර අවසන් අරමුණ සාක්ෂාත් කළ යුතුය. අවසන් අරමුණ වනුයේ නිර්වාණය සාක්ෂාත් කිරීමයි. නිවන් අවබෝධ කරගන්නා තෙක් එම මාර්ගයෙහි ගමන් කළ යුතුය. එහිදී පදනම වශයෙන් අනුගමනය කළ යුත්තේ සීලයයි. සීලය ඇති කල්හි දුෂ්චරිතය ඇති නොවේ. එවිට ආචාරධර්ම කඩ වීමක් සිදු නොවේ.

සීලය සමාධි ඥාණදස්සන චේතෝවිමුත්ති (සෝහිත හිමි, 2014: 236)

ඉහත විග්‍රහය ආකාරයෙන් සීලය පදනම වශයෙන් භාවිත කර සමාධිය වැඩි යුතුය. එයින් ප්‍රඥාව වැඩිය යුතු අතර එහි අවසන් ප්‍රතිඵලය වනුයේ අරහත් තත්ත්වය අවබෝධ කිරීමයි. අරහත් පුද්ගලයෙකු ආචාරවත් නොවන යමක් සිදු කරනු නොලබයි. ඒ අනුව නිවන් අවබෝධ කරගත්, තුන්තරා බෝධියෙන් එක් බෝධියකට හෝ පත් පුද්ගලයෙකු අතින් සදාචාරවත් නොවන යමක් සිදු නොවේ. රාග, දෝස, මෝහ ප්‍රහීණ කළ කල්හි නිවන් අවබෝධ කරගත හැකි බව නිබ්බාන සූත්‍රයෙහි දක්වා තිබේ. එයට අදාල මාර්ගය වනුයේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි (නිබ්බාන සූත්‍රය, 475). මේ අනුව පැහැදිලි වනුයේ බෞද්ධ ආචාරධර්මයන්හි පදනම සීලය වන බවය. එහෙත් සීලය ඇතිවීමට නම් ප්‍රඥාව තිබිය යුතු වේ. ඊට හේතුව වනුයේ සීලය රැකීමට ප්‍රඥාවක් තිබීම අනිවාර්ය වීමයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුව ද ප්‍රඥාව පළමු පියවරයි. ඒ අනුව ප්‍රඥාව හා සීලය සාපේක්ෂව තිබිය යුතු බව විද්වත් මතයයි. ප්‍රඥාව හා සීලය පදනම වශයෙන් උපයෝගී කරගෙන මැදුම් පිළිවෙත අනුගමනය කරන කල්හි බෞද්ධ සදාචාරයේ ඉහළම තත්ත්වය අවබෝධ කළ හැකිය.

### බෞද්ධ සදාචාර මිණුම්දඬු

සදාචාර මිණුම්දඬු පවතිනුයේ අයහපතින් යහපත වෙන්කරවා ගැනීමටත් යහපතින් අයහපත වෙන්කරවා ගැනීමටත් වාස්තවික පැවැත්ම සුරක්ෂිත කිරීමටත්ය. එසේම කළ යුතු යහපත්/හොඳ ක්‍රියා සිදු කිරීමේ දී ක්‍රියාත්මක විය යුතු ආකාරය අවබෝධ කිරීමට සදාචාර මිණුම්දඬු මහෝපකාරී වේ. බෞද්ධ ආචාරධර්මයන්හි සදාචාර මිණුම්දඬු මෙය යැයි නිශ්චිතව දක්වා නොමැත. එබැවින් සදාචාර විනිශ්චය හා සම්බන්ධ දේශනාවන් උපයෝගී කරමින් බෞද්ධ සදාචාර මිණුම්දඬු පිළිබඳ අධ්‍යයනය කළ හැකිය. සදාචාරාත්මක වශයෙන් යහපත් හා අයහපත් පැවැත්ම හැඳින්වීම පිණිස පෙළෙහි විවිධ සමානාර්ථ පද භාවිත කර ඇත.

සාධු-අසාධු, අරියධම්ම- අනරියධම්ම, කුසල-අකුසල, අත්ථ-අනත්ථ, ධම්ම-අධම්ම, සාසව-අනාසව, සාවජ්ජ-අනවජ්ජ, සුක්කමග්ග-කණ්හමග්ග, සද්ධම්ම-අසද්ධම්ම, සප්පුරිසධම්ම-අසප්පුරිසධම්ම, උප්පාදෙතබ්බ- න උප්පාදෙතබ්බ, ආසෙවිතබ්බ- න ආසෙවිතබ්බ, භාවෙතබ්බ- න භාවෙතබ්බ, බහුලීකාතබ්බ- න බහුලීකාතබ්බ ආදී වශයෙන් කිහිපයක් දැක්විය හැකිය (ප්‍රේමසිරි, 2014: 115). මේ ආකාරයේ පදයන්ගෙන් සදාචාරාත්මක යහපත් බව හා අයහපත් බව සම්බන්ධයෙන් විග්‍රහ කර තිබේ. ඒ අනුව සදාචාරාත්මක යහපත් බව හා අයහපත් බව සම්බන්ධයෙන් විවිධ තැන්හි දැක්වෙන ඉගැන්වීම් කිහිපයක් අනුසාරයෙන් බෞද්ධ ආචාරධර්ම මිණුම් දඬු පිළිබඳ අධ්‍යයනය කරනු ලැබේ. යම් ක්‍රියාවක් සිදු කිරීමේ දී බුදු දහම ප්‍රමුඛතාව ලබා දෙනුයේ චේතනාවටයි. නිබ්බේධික සූත්‍රයට අනුව කර්මය වනුයේ සචේතනික ක්‍රියාවයි. සිතින් සිතා කයින්, වචනින්, මනසින් කර්ම කරනු ලැබේ. එබැවින් දුක්ඛ නිරෝධගාමිනී පටිපදා සත්‍යයට අයත් ආර්ය අෂ්ටාංගික මාර්ගය වැඩිය යුතු වේ (නිබ්බේධික සූත්‍රය, 208-210.). ඒ අනුව බෞද්ධ ආචාරධර්ම මිණුම් තීරණය කිරීමේ සාධකය වනුයේ චේතනාවයි. චේතනාව, යහපත් චේතනාව හා අයහපත් චේතනාව වශයෙන් කොටස් දෙකකින් යුක්තය. එහිදී කර්මය හා කර්මඵල පිළිබඳ මනා සිහියෙන් කටයුතු කළ යුතු වේ. කර්මඵල පිළිබඳ අවබෝධයෙන් ක්‍රියා කරන විට අකුසල් ක්‍රියාවන්ගෙන් මිදී කුසල් ක්‍රියාවන්හි නියැළීමට හැකියාව ලැබේ. එබැවින් සදාචාර මිණුම තීරණය කරනු ලබන සාධකය වශයෙන් චේතනාව පෙන්වා දිය හැකිය.

යම් ක්‍රියාවක යහපත් හෝ අයහපත් බව නිශ්චය කරගැනීම සම්බන්ධ මිණුමක් ඛිප්පනිසන්ති සූත්‍රයෙහි අඩංගු වේ. මෙම සූත්‍රයට අනුව ලෝකයෙහි පුද්ගලයන් සතර දෙනෙකු ජීවත් වේ.

- තමාට හිත පිණිස පිළිපන්නේ මෙරමාහට හිත පිණිස නො පිළිපන්නේය
- මෙරමාහට හිත පිණිස පිළිපන්නේ තමාට හිත පිණිස නො පිළිපන්නේය
- තමාට හිත පිණිස නොපිළිපන්නේ මෙරමාහට හිත පිණිස නොපිළිපන්නේය
- තමාට හිත පිණිසත් මෙරමාහට හිත පිණිසත් පිළිපන්නේය (ඛිප්පනිසන්ති සූත්‍රය, 184.)

මෙම පුද්ගලයන් සතර දෙනාගෙන් ප්‍රශංසනයට හෙවත් ඇගයීමට පාත්‍ර වී ඇත්තේ සතර වැනි පුද්ගලයාය. තමාගේ හිතසුව පිණිස මෙන්ම අනෙකාගේ හිතසුව පිණිස ක්‍රියාකළ යුතු බව ඉන් කිය වේ. සික්ඛාපද සූත්‍රයට අනුව තමා පණිවායෙන් දුරුව, මෙරමාද පණිවායෙන් දුරු කිරීමට කටයුතු කිරීම සතරවැනි පුද්ගලයාගේ ලක්ෂණයකි. මදයට හා පමාවට හේතු වන රහමෙරින් තමා දුරු වී මෙරමා ද දුරු කරවීමට කටයුතු කරවයි (සික්ඛාපද සූත්‍රය, 190). අත්තහිත-පරහිත සූත්‍රයෙහි ද මෙවැනි සමාන ඉගැන්වීමක් දැකිය හැකිය. තමා සීල සම්පන්න වී මෙරමා සීලයෙහි සමාදන් කරවයි, තමා සමාධි සම්පන්න වී මෙරමා ද

සමාධි සම්පන්න කරවයි, තමා ප්‍රඥා සම්පන්න වී මෙරමා ප්‍රඥා සම්ප්‍රදායෙහි සමාදන් කරවයි, තමා විමුක්ති සම්පන්න වී මෙරමා විමුක්ති සම්ප්‍රදායෙහි සමාදන් කරවයි, තමා විමුක්තිඥානදර්ශන සම්පන්න වී මෙරමා ද විමුක්තිඥානදර්ශන සම්පන්නයෙහි සමාදන් කරවයි (අත්තහිත-පරහිත සූත්‍රය, 24). ආත්මාර්ථකාමීත්වය හෝ පරාර්ථකාමීත්වය යන අන්තයන්ගෙන් විතැන්ව තමා ගැන මෙන්ම අනෙකා ගැන ද සිතා කටයුතු කළ යුතු බව මෙමගින් පැහැදිලි වේ. එහෙත් ඇතැම් තැනෙක ස්වාභිවෘද්ධිය තකා කටයුතු කිරීම කළ යුතුව ඇත. මෙම විග්‍රහයෙහි එන සංකල්ප අතර දෙවනුව උසස් යනුවෙන් සලකා ඇත්තේ අන් අයගේ යහපතට වඩා තමාගේ යහපත වෙනුවෙන් කටයුතු කරන පිරිසය (වීරවර්ධන, 72). ඊට හේතුව සල්ලේඛ සූත්‍රය ඇසුරෙන් හඳුනාගත හැකිය. මඩෙහි එරුණු තැනැත්තෙකු ගොඩට ගැනිය හැක්කේ තවත් එවැනි අයෙකුට නොව ගොඩෙහි සිටින අයෙකුටය (සල්ලේඛ සූත්‍රය, 132-138). එබැවින් කටයුතු කිරීමේ දී තමා සදාචාරසම්පන්න විය යුතුය. එවිට පරාර්ථය පිණිස නිසගයෙන් කටයුතු කරනු ලැබේ. ධම්මපදයේ ද මේ හා සමාන ඉගැන්වීමක් සිදුකොට තිබේ. එහිදී බොහෝ වූ පරාර්ථය හේතුවෙන් ස්වකීය යහපත නොනැසිය යුතු බව දක්වා තිබේ (අත්තවග්ගය, ගාථාව 66).

අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයෙහි අන්තර්ගත ආචාරාත්මක උපදේශය ආචාරධර්ම මිණුමක් වශයෙන් භාවිත කළ හැකි වේ. කැඩපතකින් සිදුකරන කාර්යය සේ තමා විසින් සිදු කරනු ලබන කාර්යයන් නිතර පිරික්සා බලා කළ යුතු බව එහි කිය වේ. කාය කර්ම, වාග් කර්ම හා මනෝ කර්ම සිදු කිරීමේ දී එය තමාට දුක් පිණිස වන්නේ ද අනෙකාට දුක් පිණිස වන්නේ ද දෙදෙනාටම දුක් පිණිස වන්නේ ද, වන්නේ නම් එය අකුසල් වේ. තමා විසින් සිදු කරනු ලබන කාය කර්මය, වාග් කර්මය හා මනෝ කර්මය තමාට, අනෙකාට හා දෙදෙනාටම දුක් පිණිස නොවන්නේ ද එය කුසල සුව වඩන්නේ ද සැප විපාක දෙන්නේ ද එවැනි ක්‍රියා කුසල් දහම් වේ (අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය, 132-138). තමා යම් ක්‍රියාවක් සිදු කිරීමේ දී ක්‍රියා කළ යුතු අන්දම මින් අවධාරණය කර තිබේ. යම් කාර්යක් සිදු කිරීමේ දී හිතාබලා මනා සිහියෙන් කළ යුතු වේ. කුසල ධර්මයක් වනුයේ තමාට අනෙකාට සහ දෙදෙනාටම කරදරයක් හෝ දුකක් නොවන ක්‍රියාවක්ය. එලෙස තමාට, අනෙකාට හා දෙදෙනාටම දුකක් වන්නේ නම් එය අකුසලයක් වේ. කැඩපතකින් (ආදාස උපමාව) මුහුණ බලන්නාක් මෙන් කටයුතු කිරීමේ දී ප්‍රත්‍යවේක්ෂණය කළ යුතුය. ඒ අනුව මෙය ආචාරධර්ම මිණුමක් වශයෙන් භාවිත කළ හැකි වේ. යම් ක්‍රියාවක් අකුසලයක් නොවී කුසලයක් වන අයුරු ඉන් ප්‍රකට කරයි. මීට අමතරව දේවදූත වග්ගයෙහි ද හොඳ නරක නිශ්චය කිරීම සම්බන්ධයෙන් කරුණු දක්වාලීමක් සිදු කර තිබේ.

- අත්තාධිපතෙය්‍යය
- ලෝකාධිපතෙය්‍යය
- ධම්මාධිපතෙය්‍යය (දේවදූත වග්ගය, 268-270)

ලෝකයෙහි ඇති අධිපති ධර්ම ත්‍රිත්වයක් ඉහත දක්වා ඇත. පුද්ගලයා විසින් කටයුතු කිරීමේ දී තමාගේ හෘද සාක්ෂිය, ලෝකය හා ධර්මය අධිපති කොට කටයුතු කළ යුතු වේ. එසේ නොමැති කල්හි තමාටම උපවාද කරනු ලැබේ. පළමුවෙන් තමා අධිපති කර අකුසලය දුරු කළ යුතුය. තමා අධිපති කොට කුසලය වැඩිය යුතුය. දෙවනුව 'ලෝක සම්මතය අධිපති කොට අකුසලය දුරුකොට කුසලය වැඩිය යුතුය. ලෝකසන්නිවාසය යහපත්ය, ලෝකයෙහි ඍද්ධිමත් මහණ බමුණෝ ඇත, ඔවුහු දුරිනුදු දක්නාහ, ඔවුහු මාගේ සිත් දක්නාහ' ආදි වශයෙන් ලෝකය අධිපති කර කුසලය වැඩිය යුතු වේ. එසේ නොවන කල්හි අකුසල් ඇති වේ. තෙවනුව ධර්මය අධිපති කර කටයුතු කළ යුතු බව දේශනා කර ඇත. එහිදී බුදුන් වහන්සේ විසින් නවලෝකෝත්තර ධර්මය දේශනා

කළහ. එබැවින් මෙම ධර්මය අධිපති කර කුසලය වැඩිය යුතුය. අකුසලය දුරුකළ යුතු වේ. ඒ අනුව යමක් සිදු කිරීමේ දී අධිපති දෑ වශයෙන් මෙම උපදේශනය භාවිත කරන්නේ නම් අයහපත් දෙයක් සිදු නොවේ. එබැවින් එය ආචාරධර්ම මිණුමකි. තමා විසින් සිදු කරනු ලබන ක්‍රියාව අධිපති ධර්ම ඔස්සේ විශ්ලේෂණය කළ යුතුය. අධිපති ධර්මයන්ට නොගැලපෙන යමක් සිදු නොවනවා යනු අයහපතක් ඇති නොවීමයි.

කාලාම සූත්‍රයෙහි ද (කේසමුට්ටී සූත්‍රය) ආචාරධර්ම මිණුම හා සම්බන්ධ ඉගැන්වීමක් අන්තර්ගත වේ. කාලාමයන්ට ස්වච්ඡන්දතාව පිළිබඳව කරුණු දහයක් දක්වාලීමෙන් අනතුරුව යම් දෙයක් විනිශ්චය කළ යුතු ආකාරය දේශනාකර තිබේ. එහිදී දේශනා කර ඇත්තේ 'මේ ධර්මයෝ කුසලය, මේ ධර්මයෝ අකුසලය, මේ ධර්මයෝ නුවණැත්තන් විසින් ප්‍රශංසාර්හය, මේ ධර්මයෝ හිතසුව පිණිස පවතී' (මහාවග්ගය, 342) යනුවෙන් තමාම දැනගන්නේ නම් එය ලැබගෙන වාසය කළ යුතු බව බුදුන් වහන්සේ දේශනා කර තිබේ. පූර්වයෙන් දැක් වූ ආචාරධර්ම මිණුම්වලට අමතරව 'නුවණැත්තන් විසින් ප්‍රශංසාර්හ කටයුතු දෑ' පිළිගත යුතු බව දක්වා ඇත. මෙහිදී සියලු දෙනා ප්‍රශංසාවට ලක් කරන දෙය පිළිබඳ සැලකිල්ලක් නොදක්වා විශේෂ වශයෙන් දක්වා ඇත්තේ නුවණැත්තන්ය. ඒ අනුව සත්‍ය දැනගත්තා වූ කුසල් දහම් වඩන නුවණැත්තන් විසින් ප්‍රශංසා කරන්නේ නම් එය යහපත් වේ. මෙයින් දක්වා ඇත්තේ නුවණැත්තන් විසින් ප්‍රශංසා කිරීම සදාචාර මිණුමක් යන්නය.

මීට අමතරව ස්වර්ණ රීතිය (Golden rule) ද බෞද්ධ සදාචාර මිණුමක් වශයෙන් භාවිත කළ හැකිය. යමෙක් තමාට කරනවාට අකමැති යම් ක්‍රියාවක් තමන් විසින් ද අන් අයට නොකළ යුතු බව ස්වර්ණමය රීතියෙන් කියැවෙයි (වීරවර්ධන, 68). ධම්මපදයෙහි (දණ්ඩවග්ගය) 129 හා 130 ගාථාවන්ගෙන් කියැවෙනුයේ ඒ සම්බන්ධ ඉගැන්වීමකි. තමා උපමාකර ගනිමින් හිංසා පීඩා නොකළ යුතු බවත් අනුන් ලවා නොකරවිය යුතු බවත් උගන්වා ඇත. ඒ අනුව නිරන්තරයෙන් තමා උපමාවට ගෙන ක්‍රියා කළ යුතු වේ. යම් දෙයක් සිදු කිරීමේ දී එය තමාට හානිකර වන්නේ නම් එය අනෙකාට ද හානිකර වේ. එබැවින් කටයුතු කිරීමේ දී තමා මිණුමක් වශයෙන් හඳුනා කටයුතු කළ යුතු බව බුදුන් වහන්සේ දේශනා කර ඇත. ධම්මපදයෙහි 67 වන ගාථාවේ ද සදාචාර මිණුම් කිහිපයක් දක්නට ලැබේ. යම් ක්‍රියාවක් සිදුකොට පසුතැවිලිවේ ද, යම් විපාකයක් කඳුළු පිරුණු මුහුණින් යුතුව විඳ දරා ගැනීමට සිදුවේ ද එවැනි ක්‍රියා නොකළ යුතු බව එහි සඳහන් වේ (බාලවග්ගය, ගාථාව 40). ඒ අනුව යම් ක්‍රියාවක විපාකය සදාචාර මිණුමක් වශයෙන් භාවිත කළ යුතු බව මෙමගින් අවධාරණය කර තිබේ.

**සමාලෝචනය**

බෞද්ධ ආචාරධර්ම මිණුම් විවිධ දේශනාවන්හි විවිධාකාරයෙන් විග්‍රහ කොට ඇති බව හඳුනාගත හැකිය. බෞද්ධ සදාචාර මිණුම්වල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණය වනුයේ සදාචාර මග පෙන්වීමක් පමණක් සිදුකර තිබීමයි. සදාචාර විධානයක් බෞද්ධ ආචාරධර්මවල දැකිය නොහැකිය. කුසලය හා අකුසලය වෙන්කර අවබෝධ කිරීමට මග පෙන්වා ඇත. විශේෂයෙන් කුසලය කළ යුතු බවට සහ අකුසලය නොකළ යුතු බවට විවිධ දේශනා සිදුකර තිබේ. බුදුන් වහන්සේ පමණක් නොව ශ්‍රාවකයන් වහන්සේලාගේ දේශනාවල ද මෙවැනි ඉගැන්වීම් දක්නට ලැබේ. ආනන්ද හිමියන්ගේ දේශනයක් අන්තර්ගත බාහිතික සූත්‍රයේ ද කොසොල් රජුට අවවාද වශයෙන් ලබා දී ඇත්තේ කුසලය කළ යුතු බවයි. කාය, වාග් හා මනෝ සංවරය වැදගත් බව ද එහි සඳහන් වේ (බාහිතික සූත්‍රය, 547). එහිදී කර්ම හා කර්ම ඵල පිළිබඳ අවබෝධයක් ද තිබිය යුතු වේ. සියල්ලෙහි අවසාන විපාකය කර්ම කාරකයාට ලැබෙන බැවින් තම චේතනාව

පිරිසිදු කළ යුතුය. එබැවින් චේතනාව කර්මය වශයෙන් දේශනා කර ඇත. විවිධ සූත්‍ර දේශනාවන්හි ඇති ආකාරයට යමක් කිරීමට පෙර එය කුසල ද අකුසල ද යන්න සිතිය යුතුය. එය කුසලයක් වන්නේ නම් සැප විපාක ගෙනදෙන බවත් අකුසලයක් වන්නේ නම් දුක් විපාක ගෙනදෙන බවත් දේශනා කර තිබුණ ද නියත වශයෙන් මෙය කරන්න යන සදාචාර විධානය බෞද්ධ ආචාරධර්මවල දැකිය නොහැකිය.

මේ ආකාරයට හඳුනාගත හැකි පරිදි බෞද්ධ ආචාරධර්ම යන්න නිර්වචනය කළ හැකි වනුයේ විසුළ තේමාවක් වශයෙනි. කාල බේදයකින් තොරව වාස්තවික කළ හැකි ආචාරධර්ම පද්ධතියක් ලෙස සැකෙවින් පෙන්වා දිය හැකිය. බෞද්ධ ආචාරධර්මයන්හි සැකැස්ම හැඩගැස්වීමෙහිලා පූර්ව මතවාද යම් හෙයකින් බලපා තිබුණ ද බුදු දහමට අනන්‍ය වූ ආචාරධර්ම පද්ධතියක් පවත්නා බව පෙන්වා දිය හැකිය. එය පැවිදි-ගිහි යනුවෙන් වෙන්ව වෙන්ව තිබුණ ද පරමාර්ථමය වශයෙන් වෙනසක් දැකිය නොහකිය. ඊට හේතුව වනුයේ අවසාන අරමුණ නිවන වීමයි. බුදුදහමට අනුව නිවන් පිණිස වන ඕනෑම ක්‍රියාවක් සදාචාර ක්‍රියාවකි. ඉන් පරිබාහිර ක්‍රියා සාදාචාර නොවන ක්‍රියා ලෙස පෙන්වා දිය හැකිය. එය බෞද්ධ සදාචාර මිණුම්දඬුවලින් මනාව වෙන්කරවා ගත හැක. ඒ අනුව සමාජ පැවැත්ම සාධනයෙහිලා උපයෝගී වන පරිපූර්ණ සදාචාර පද්ධතියකින් බුදුදහම සමන්විත බව මෙම සියලු කරුණුවලින් පැහැදිලි වේ.

### ආශ්‍රිත ග්‍රන්ථ

### ප්‍රාථමික මූලාශ්‍රය


*අංගුත්තර නිකාය.* චතුක්කනිපාතය, අසුර වග්ගය, අත්තහිත පරහිත සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*අංගුත්තර නිකාය.* චතුක්කනිපාතය, අසුර වග්ගය, සික්ඛාපද සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*අංගුත්තර නිකාය.* චතුක්කනිපාතය, බිජ්පනිසන්ති සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*අංගුතතර නිකාය.* ඡක්කනිපාතය, මහාවග්ගය, නිබ්බේදික සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*අංගුත්තර නිකාය.* තික නිපාතය, දේවදූත වග්ගය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*අංගුත්තර නිකාය.* තික නිපාතය, මහාවග්ගය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*ඛුද්දක නිකාය.* ධම්මපදපාළි, බාලවග්ගය, අත්ත වග්ගය, දණ්ඩ වග්ගය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*දීඝ නිකාය.* සීලක්ඛන්ධවග්ගය, සොණදණ්ඩ සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*මජ්ඣිම නිකාය.* මජ්ඣිම පණ්ණාසකය, භික්ඛු වග්ගය, අම්බලට්ඨික රාහුලොවාද සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*මජ්ඣිම නිකාය.* මූල පණ්ණාසකය, සල්ලේඛ සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*මජ්ඣිම නිකාය.* රාජ වග්ගය, බාහිතික සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*සංයුත්ත නිකාය.* සගාථවග්ගය, බ්‍රාහ්මණ සංයුත්තය, ජටා සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*සංයුත්ත නිකාය.* සළායතනවග්ගය, ජම්බුඛාදක සංයුත්තය, නිබ්බාන සූත්‍රය. බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව. කොළඹ: ලංකාණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

### ද්විතීයික මූලාශ්‍රය


කලුපහන, ඩී.ජේ., 2005. *මුල් බුදුසමයෙහි ආචාර විද්‍යාව.* තිවිර ප්‍රකාශන.

ධම්මානන්ද හිමි, එච්., 2004. *බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය.* කොළඹ 10ඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මසිරි, ජී., 1996. *බෞද්ධ සදාචාරයේ මූලධර්ම.* නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

තිලකරත්න, හේ.මු., 2001. *මහාචාර්ය කේ.එන්. ජයතිලක දර්ශනය.* කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඥාණසුමන හිමි, ඩී., 1980. *ආදි බෞද්ධ දර්ශනයේ මූල ධර්ම.* අම්බලන්ගොඩඃ විවේකාරාමාරක්ෂක දායක සභාව.

ප්‍රේමසිරි, පී. ඩී., 1992. *බෞද්ධ ආචාර ධර්ම.* කොළඹඃ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.

වීරවර්ධන, එස්., 2007. *ආචාර විද්‍යා අධ්‍යයන ලිපි.* ස්ථානය සඳහන් නොවේඃ කර්තෘ ප්‍රකාශන.

ෆ්‍රැන්කීනා, ඩබ්ලිව්.කේ., 1998. *ආචාර විද්‍යාව.* (පරිව. පී. ඩී. ප්‍රේමසිරි). කොළඹ 10ඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඥාණරතන හිමි, එන්., 2009. *බෞද්ධ ආචාරධර්මයන්හි පදනම.* නිවන් මග බෞද්ධ ආචාරධර්ම. (සංස්. එච්.එම්. ගුණතිලක). කොළඹඃ ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය.

පේමසිරි හිමි, ඒ., 2010. *බෞද්ධ ආචාරවිද්‍යාව යනු කුමක් ද?.* බෞද්ධ ආචාරවිද්‍යාව. (සංස්. පනාමුරේ චන්දිම හිමි සහ තවත් අය). මිරිස්වත්තඃ පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය.

ප්‍රේමසිරි, පී. ඩී., 2014. *බෞද්ධ ආචාර ධර්මය තුළ කුසල පුඤ්ඤ සංකල්පවල භූමිකාව.* බෞද්ධ හා පාලි අධ්‍යයන. (සංස්. ගොඩගම මංගල හිමි සහ මාදිපොල විමලජෝති හිමි). කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේරත්න, ආ., 2005. *බෞද්ධ සදාචාර ධර්මයන්හි පදනම පිළිබඳ හැඳින්වීමක්.* සම්මානි. (සංස්. ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි සහ කොටගම වාචිස්සර හිමි). වැල්ලම්පිටිය.

සෝහිත හිමි, කේ., 2014. *බෞද්ධ සදාචාර දර්ශනය.* බෞද්ධ හා පාලි අධ්‍යයන. (සංස්. ගොඩගම මංගල හිමි සහ මාදිපොල විමලජෝති හිමි). කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.


### English


Barbra R. Clayton. (2016). "Buddhist Ethics", The Oxford Hand book of World Philosoph.y (ed.)

William Edelglass and Jay L. Garfield (United Kingdom: Oxford University press,

Keown, Damiem. (1992) The Nature of Buddhist Ethics. New York: palgrave macmillan.

Silva, Padmasiri de. (1998). Environmental Philosophy and Ethics In Buddhism. New York: ST.Martin's press.

https://www.researchgate.net/publication/350312209, (accessed 12 March 2024).

http://repo.busl.ac.lk/handle/1/2518 (accessed 12 March 2024).